පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ, ශ්‍රී ලංකා.

பாராளுமன்றம்
ஸ்ரீ ஜயவர்தனபுர,
கோட்டே, ஸ்ரீ லங்கா.

PARLIAMENT
SRI JAYAWARDENAPURA,
KOTTE, SRI LANKA.

මුජිබුර් රහුමාන්
පාර්ලිමේන්තු මන්ත්‍රී

முஜீபுர் றஹ்மான்
பாராளுமன்ற உறுப்பினர்

**Mujeebur Rahuman**
*Member of Parliament*

317, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ - 10.
දුර: 0112 335613

317, ஜயந்த வீரசேகர மாவத்தை,
கொழும்பு-10.
தொலைபேசி: 0112 335613

317, JAYANTHA WEERASEKARA MAWATHA,
COLOMBO - 10.
TEL : 011 2335613

2025.01.04

ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා
ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ
ජනාධිපතිතුමා
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ 01

අතිගරු ජනාධිපති තුමනි,

**රොහින්ග්‍යා යුද අනාථයන් මියන්මාරයට පිටුවහල් නොකරන ලෙස ඉල්ලීමයි.**

මුලතිව් මුහුදේ අතරමංව සිටියදී ධීවරයන් විසින් දෙසැම්බර් 19 දා බේරාගෙන රජයට බාරදීමෙන් පසු දැන් මුලතිව් ගුවන් හමුදා කඳවුරේ රඳවාගෙන සිටින රොහින්ග්‍යා සරණාගතයන් පිරිස ආපසු මියන්මාරයට පිටුවහල් කිරීමට ආණ්ඩුව ගෙන ඇති තීරණය අපේ බලවත් කම්පාවට හේතු වෙයි. යුද බියෙන් ජීවිත බේරාගැනීමට පලායන මෙම අසරණයන් 103 දෙනා අතර දරු දැරියන් හතලිහකට වැඩි සංඛ්‍යාවක් ඉන්නා බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම නිවේදනය කර ඇත. ඔවුන්ගේ අපේක්ෂාව ආරක්ෂිත රටක දේශපාලන රැකවරණ ලබාගැනීමයි.

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ආනන්ද විජේපාල විසින් ජනමාධ්‍යට ප්‍රකාශ කර ඇති පරිදි රජයේ සැලසුම ඔවුන් මියන්මාරයටම පිටුවහල් කිරීමයි. ඔවුන්ගේ නම් ලැයිස්තු ඒ ආණ්ඩුවට ලබාදී ඇති බවද ඔහු ප්‍රකාශ කර තිබේ. එය මේ සැමදෙනාගේම පමණක් නොව මියන්මාරයේ වෙසෙන ඔවුන්ගේ ඥාති මිත්‍රාදීන්ගේ ජීවිත පවා අනතුරේ හෙළීමක් බව අපේ දැඩි විශ්වාසයයි. එපමණක් නොව ඔවුන් මියන්මාරයට යැවීම යම් රටකදී අනතුරකට ගොදුරු වීමේ අවදානමක් සහිත පුද්ගලයන් ඔවුන්ගේ කැමැත්තෙන් තොරව එම රටටම ආපසු යැවීමෙන් වැළකී සිටීමේ (Non-Refoulement) ජාත්‍යන්තර නෛතික මූලධර්මයටද හරස්ව යාමකි. ඔබතුමාගේ පාලන කාලය තුල මෙරටට ඇතුල්වූ මුල්ම සරණාගත පිරිස ඔවුන් පැමිණි රටේ මාර මුඛයට යැවීමෙන් ලෝකයා හමුවේ රටට අත්වන්නේ කැළලකි.

ජාතිවාදී ගැටුම්වලින් ගලාගිය ලෙයින් තෙත්වූ දේශයක ජනතාව ඒ ඉරණමින් ගලවා නොගෙන දැන, දැනම අනතුරේ හෙළීම ජාතිවාදී ගැටුම් වලින් පීඩාවට පත්වූ මේ දේශය සුවපත් කිරීමට පාර්ලිමේන්තුවේ මංගල දේශනයෙන් පොරොන්දු දුන් රාජ්‍ය නායකයා වන ඔබතුමාට තරම් නොවේ. දශක කිහිපයක් යටිබිම්ගත දේශපාලනයක සැඟවෙන්නට බලකෙරුණු පක්ෂයක නායකයා වන ඔබතුමා රාජ්‍ය මර්දනයේ තරම කටුක අත්දැකීමෙන්ම දනී.

එමනිසා, ශ්‍රී ලංකාවේ රඳවාගෙන සිටින රොහින්ග්‍යාවරුන් පිරිස තමන්ගේ සුරක්ෂිත භාවය සහතික කෙරෙන තවත් රටකට යනතුරු මියන්මාරයට පිටුවහල් නොකර තවදුරටත් අපේ රට තුලම ඔවුන්ගේ සුබසිද්ධිය සලසා දී, මානව හිමිකම් සුරකින, අසරණයන්ට සරණ වන ශ්‍රී ලාංකික ආගන්තුක සත්කාරයේ අසිරිය ලොවට විදහා දැක්වීමට මෙය අවස්ථාවක් කරගන්නා මෙන් උදක්ම ඉල්ලා සිටිමි. ඒ සද්ක්‍රියාව සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු සංවිධානවල පමණක් නොව විපක්ෂයේද සහාය ඔබතුමාට ලැබෙනු ඇති බව අපේ විශ්වාසයයි.

ස්තූතියි

මෙයට

……………………

මුජිබුර් රහුමාන්
පාර්ලිමේන්තු මන්ත්‍රී

මුජිබුර් රහුමාන්
පාර්ලිමේන්තු මන්ත්‍රී
කොළඹ දිස්ත්‍රික්කය
317, ජයන්ත වීරසේකර මාවත,